# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2010
2012 අප්‍රේල්/මැයි/ජූනි

සමාජීය විද්‍යා පීඨය

ආර්ථික විද්‍යාව - ECON- E 3015

සාර්ව ආර්ථික විද්‍යාව

<u>ප්‍රශ්න හතරකට (04) පමණක්</u> පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි. කාලය : පැය 03 යි.

---

01. i. සාර්ව ආර්ථිකවිද්‍යාව (Macroeconomics) සහ සූක්ෂම ආර්ථිකවිද්‍යාව (Microeconomics) යන විෂය ක්ෂේත්‍ර අතර ඇති වෙනස්කම් පැහැදිලි කරන්න.

    ii. රටක සාර්ව ආර්ථික අරමුණු ඉටුකර ගැනීම සඳහා රජයකට යොදාගත හැකි ප්‍රතිපත්තිමය උපකරණ පිළිබඳව හැඳින්වීමක් කරන්න.

02. i. 'සේගේ වෙළඳපොළ පිළිබඳ න්‍යාය (Say's Law of Markets) සහ මුදල් ප්‍රමාණවාදය (Quantity Theory of Money) සම්භාව්‍ය ආර්ථික විද්‍යාවේ වැදගත් න්‍යායයන් දෙකක් ලෙස සළකන්නේ කවර හේතු නිසාදැයි පැහැදිලි කරන්න.

    ii. සමස්ථ ඉල්ලුම (Aggregate Demand) සමස්ථ සැපයුම (Aggregate Supply) සහ සාර්වආර්ථික සමතුලිතතාවය (Macroeconomic Equilibrium) යන සංකල්ප පැහැදිලි කරන්න.

03. i. පොළී අනුපාතිකය තීරණය වීම පිළිබඳ සම්භාව්‍ය න්‍යාය සහ ද්‍රවශීලතාවරණ න්‍යාය අතර ඇති වෙනස්කම් පෙන්වා දෙන්න.

    ii. ද්‍රවශීලතා පාශය හෙවත් උගුල (Liquidity Trap) යන්නෙන් කුමක් අදහස් වේද? මෙම සංකල්පයේ ඇති ප්‍රායෝගික වැදගත්කම කුමක්ද?

04. සේවා නියුක්තිය තීරණය වීම පිළිබඳ කේන්ස් ගේ න්‍යායය, සම්භාව්‍ය න්‍යායයෙන් වෙනස්වන ආකාරය පැහැදිලි කරන්න.

05. i. රටක උද්ධමනීය තත්වයක් ඇතිවීමේ ප්‍රතිවිපාක කවරේද?

    ii. උද්ධමනය පැහැදිලි කරන විවිධ න්‍යායයන් පිළිබඳව කෙටියෙන් සාකච්ඡා කරන්න.

    iii. උද්ධමනය හා සේවා වියුක්තිය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතීය යන පිලිප්ස් වක්‍ර විශ්ලේෂණය පැහැදිලි කරන්න.

06. i. IS – LM සමතුලිතතාවය යන්නෙන් කුමක් අදහස් වේද?

ii. IS – LM වක්‍රවල විතැන්වීමට බලපාන කරුණු පැහැදිලි කරන්න.

iii. IS – LM විශ්ලේෂණයේදී කේන්ස්වාදීන්ගේ (Keynesians) හා මූල්‍යවාදීන්ගේ (Monetarists) අදහස්වලඇති වැදගත්කම පෙන්වා දෙන්න.

07. i. කුටුම්බක අංශය සහ නිෂ්පාදන ආයතන ඇතුලත් සරල ආවෘත ආර්ථිකයක සිට ඉතිරිකිරීම්, ආයෝජන, රාජ්‍ය අංශය සහ විදේශ අංශය ඇතුලත් වන පරිදි ජාතික ආදායමේ චක්‍රීය ප්‍රවාහයක් (Circular Flow of Income) ගොඩනංවා එකී ප්‍රවාහයේ ඇතුළත් කාන්දුවීම් (Leakages) සහ විදීම් (Injections) පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න.

ii. පරිභෝජන ශ්‍රිතය (Consumption Function) යනුවෙන් කුමක් අදහස් වේද?

iii. ආන්තික පරිභෝජන නැම්යාව (MPC) සහ ආන්තික ඉතුරුම් නැම්යාව (MPS) යන සංකල්ප පැහැදිලි කරන්න.

iv. සරල රේඛීය පාරිභෝජන ශ්‍රිතය $C = 50 + .8\,Y$ ලෙස දී තිබෙන විටෙක ආන්තික පරිභෝජන නැම්යාවේ සහ ආන්තික ඉතුරුම් නැම්යාවේ වටිනාකම ගණනය කරන්න.

v. ගුණකය සහ තුලිත අයවැය ගුණකය යන සංකල්ප පැහැදිලි කරන්න.

********************************